**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. 369/21 | දිනය / திகதி / Date 2022.04.20 |

පැමිණිලි පාර්ශවය : කේ.ටී.ඩී. කීර්තිනාත් මයා,
නො 317/10/1/1,
මහා වීදිය,
අම්බලන්ගොඩ.

වගඋත්තර පාර්ශවය

01 විදුහල්පති,
ධර්මාශෝක විදුහල,
අම්බලන්ගොඩ.

02 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

03 අධ්‍යක්ෂ (ජාතික පාසල් ශාඛාව),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : එච්ආර්සී/369/21</u>

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

උක්ත පැමිණිලිකරු විසින් 2021-03-08 දාතමින් ඉදිරිපත් කර ඇති සිය මුල් පැමිණිල්ල සහ ඒ සමග ඉදිරිපත් කර ඇති අනෙකුත් ලේඛන මගින් සහ පැමිණිල්ලට අදාලව පැවති වැඩිදුර විමර්ශනයේදී ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් මගින් ප්‍රකාශ කර ඇත්තේ 2021 වසරේ අම්බලන්ගොඩ ධර්මාශෝක විදුහලේ පළමු ශ්‍රේණියට තම පුත්‍රයා ඇතුළත් කිරීම සඳහා රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම්/ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් යන ගණය යටතේ අයදුම්පත් ඉදිරිපත් ඉදිරිපත් කර ඇත. පසුව ඒ සම්බන්ධයෙන් පැවති සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරු විසින් මුළු ලකුණු 73 ක් ලබා ඇති බවත් තාවකාලික ලේඛනය ප්‍රසිද්ධ කිරීමේදී තම දරුවාගේ නම පොරොත්තු ලේඛනයේ 2 වන ස්ථානයේ සඳහන්ව තිබූ බව ප්‍රකාශ කර ඇති අතර ඒ අනුව ඉහත ගණය යටතේ 2021 වසරේ මෙම පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති බවට ප්‍රසිද්ධ කර තිබූ ලේඛනයේ නම් සඳහන් දරුවන් සම්බන්ධව සොයා බැලීමක් සිදු කල බවත් එහිදී චක්‍රලේඛයේ 7.6 වගන්තියට පටහැනිව දරුවන් දෙදෙනෙකු ඇතුළත්ව ඇති බවට තොරතුරු




| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary: 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996 | වෙබ් / இணையம் / Web: www.hrcsl.lk |

අනාවරණය වී තිබූ බවත් සඳහන් කරයි. පසුව ඒ සම්බන්ධව ධර්මාශෝක විදුහලේ එවකට විදුහල්පති හසිත කේසර වෙත්තමුණි මහතා මුණ ගැසී සාකච්ඡා කල බවත් ඒ වනවිට අභියාචනා විරෝධතා ආදිය පරීක්ෂා කර අවසන් බැවින් ඒ පිළිබඳව කටයුතු කල නොහැකි බව හිටපු විදුහල්පතිවරයා ප්‍රකාශ කර ඇති බවද සඳහන් කර ඇත. ඉන් පසුව තමා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මේ සම්බන්ධව පැමිණිලි කිරීමට කටයුතු කල බවත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධව යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු බවත් පසුව තොරතුරු දැන ගැනීමේ පනතේ ප්‍රතිපාදන යටතේ ඉහත සඳහන් දරුවන් දෙදෙනාගේ ඇතුලත් වීමට අදාළ විස්තර ලබා ගත් බවත් ඒ අනුව එම ඇතුලත් කිරීම් සිදු කර ඇත්තේ 29/2019 චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව බව තමන්ට දැන ගැනීමට ලැබුණු බවත් ප්‍රකාශ කරන අතර ඒ සම්බන්ධයෙන් ධර්මාශෝක විදුහලේ විදුහල්පති ඇතුළු පරිපාලනය වෙත කරුණු දැක්වුවත් ඔවුන් ඒ සම්බන්ධව තමන් වෙත සහනයක් සලසා දීමට කටයුතු නොකල බව පවසයි. ඒ අනුව තමන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මේ සම්බන්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් ඉහතින් සඳහන් කර ඇති පරිදි එම වගඋත්තරකරුවන් විසින් පැමිණිල්ලේ ප්‍රශ්නගත කාරණයේදී තම මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බව සහ ඒ සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

### වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම

### 01 විදුහල්පති, අම්බලන්ගොඩ ධර්මාශෝක විදුහල කරුණු දැක්වීම

මෙම පැමිණිල්ලට අදාලව මානව හිමිකම් කොමිෂන් සභාවේ දැන්වීම පරිදි ලිඛිත කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇති විදුහල්පති කේ.එස්.එච්. ජයවික්‍රම මහතා ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු වන කේ.ටී.ඩී. කීර්තිනාත් මහතා ධර්මාශෝක විදුහලේ 2021 වසරේ පළමු ශ්‍රේණියට තම පුත්‍රයා වන සවිඳු කාරියවසම් දරුවා රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම්/ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් යන ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් පැවති සම්මුඛ පරීක්ෂණයේදී ඔහු මුළු ලකුණු 72 ක් ලබා ඇති බවත් එම ගණය යටතේ දරුවන් ඇතුලත් කර ගැනීමට අදාළ කඩඉම් ලකුණ වී ඇත්තේ ලකුණු 75 බවත් ඒ අනුව එම කඩඉම් ලකුණු සීමාව ඇතුලත සිටි දරුවන් 7 දෙනෙකු ඇතුලත් කර ගැනීමට කටයුතු කර ඇති බවත් පැමිණිලිකරුගේ දරුවා ඇතුළු ඊට අඩු ලකුණු ලබා ඇති දරුවන් පොරොත්තු ලේඛනයට ඇතුලත් කර ඇති බවත් ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා පොරොත්තු ලේඛනයේ දෙවන ස්ථානයට පත්ව ඇති බව ප්‍රකාශ කර ඇත. මෙම පැමිණිලිකරු විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ඇති ලකුණු ප්‍රමාණය සඳහා එකගතාවය පළ කර අත්සන් කර ඇති අතර අභියාචනා විරෝධතා ඉදිරිපත් කිරීමට නියමිත සති 2 ක කාලය තුල තෝරා ගෙන ඇති දරුවන් සම්බන්ධව එවැනි විරෝධතාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොමැති බවද ප්‍රකාශ කර ඇත. අභියාචනා විරෝධතා ඉදිරිපත් කිරීමට චක්‍රලේඛය ප්‍රකාරව අවස්ථාව හිමිව තිබූ සති 2 ක කාලයෙන් පසුව පැමිණිලිකරු විසින් විරෝධතා ඉදිරිපත් කර තිබූ දරුවන් දෙදෙනා ඇතුලත් කර ගැනීම සිදු කර ඇත්තේ 29/2019 චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි බව වැඩිදුරටත් විදුහල්පතිවරයා සිය ලිඛිත කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කර ඇත. ඊට අමතරව පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී ධර්මාශෝක විදුහල නියෝජනය කරමින් සහභාගී වී ඇති නියෝජ්‍ය විදුහල්පති ඩී.එල්.එස්.කේ. මධුරංග මහතා විසින් ඉහත පරිදි විදුහල්පතිවරයා ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීමේ අන්තර්ගතය නැවත ඉදිරිපත් කර ඇති අතර එහිදී ධර්මාශෝක විදුහලේ ස්ථාවරය වී ඇත්තේ චක්‍රලේඛය ප්‍රකාරව මෙම පැමිණිලිකරු විසින් අභියාචනා විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී ඇති සති 2 ක කාලය තුළ එම විරෝධතා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හෝ අභියාචනා විරෝධතා මණ්ඩලයට මේ පිළිබඳව ක්‍රියා කළනොහැකි තත්වයක් උද්ගත වී තිබුණු බවත් පැමිණිලිකරු විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ අභියාචනය පරිදි අමාත්‍යාංශය මගින් මේ සම්බන්ධව ලබා දෙන උපදෙස් පරිදි කටයුතු කිරීමට විදුහල්පතිවරයාට හැකියාව ඇති බවත්ය.

**ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ කරුණු දැක්වීම**

මෙම පැමිණිල්ලට අදාල වැඩිදුර විමර්ශනයේදී 2021-04-05 දාතමින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැන්වීමක් සිදු කර ඇති අතර ඊට මේ දක්වා ප්‍රතිචාර දැක්වීමක් සිදු කර නැත. ඊට අමතරව වැඩිදුර විමර්ශනයේදී 2021-12-21 දින පැවති පරීක්ෂණය සඳහා අධ්‍යක්ෂ, ජාතික පාසල් ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය කැඳවා ඇති අතර 2022-02-22 දින පවත්වා ඇති පරීක්ෂණය සඳහා ද අධ්‍යක්ෂ (ජාතික පාසල්) අධ්‍යාපන අමාතයාංශය වගඋත්තර පාර්ශවයක් ලෙස කැඳවා ඇති අතර එම කැඳවීම සඳහා ප්‍රතිචාර දැක්වීමක් සිදු කර නැත.

**විමර්ශනය**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් කෙරෙහි අවධානය යොමු කිරීමේදී ප්‍රධාන වශයෙන් සලකා බැලිය යුත්තේ 2021 වසරේ රජයේ පාසල් වල පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කර ගැනීමට අදාලව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති 29/2019 චක්‍රලේඛයේ ප්‍රතිපාදන පිළිබඳවයි. ඒ අනුව පැමිණිලිකරු විසින් සිය දරුවා ධර්මාශෝක විදුහලේ පළමු ශ්‍රේණියට රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම්/ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් යන ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කැඳවා ඇති සම්මුඛ පරීක්ෂනයේදී මුළු ලකුණු 72 ක් ලබා ඇති බව අනාවරණය වී ඇත. එම ගණය යටතේ කඩඉම් ලකුණ වී ඇත්තේ ලකුණු 75 කි. ඒ අනුව පැමිනිලිකරුගේ දරුවා පොරොත්තු ලේඛනයේ 2 වන ස්ථානයට පත්ව ඇත. වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇති ආකාරයට පැමිණිලිකරු විසින් චක්‍රලේඛ ප්‍රකාරව අභියාචනා විරෝධතා ඉදිරිපත් කිරීමට නියමිත සති 2 ක කාලය තුළ අභියාචනයක් හෝ විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොමැත. කෙසේ වෙතත් පැමිණිලිකරු කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ වලදී සහ සිය ලිඛිත කරුණු දැක්වීම් මගින් ප්‍රකාශ කර ඇත්තේ අයදුම්කරුවන් දෙදෙනෙකු චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව සිය දරුවන් ඇතුලත් කර ඇති බවට පසුව අනාවරණය වීම හේතුවෙන් ඉහත සති 2 ක කාලසීමාව තුළ විරෝධතා ඉදිරිපත් කිරීමට තමන්ට හැකියාව නොතිබූ බැවින් පසුව ඒ පිළිබඳව ක්‍රියාත්මක වූ බවයි. ඒ අනුව තොරතුරු දැන ගැනීමේ පනතේ ප්‍රතිපාදන පරිදි එම අයදුම්කරුවන් දෙදෙනාගේ සුදුසුකම් සම්බන්ධව සොයා බැලීමේදී ඔවුන්ගේ ස්ථාන මාරු සම්බන්ධව ගැටළු පවතින බව නිරීක්ෂණය වූ බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව තෝරා ගත් ලේඛනයට ඇතුලත්ව ඇති පෙරුමාදුර ඉදුනිල් ප්‍රියංගණි ද සොයිසා නමැති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කරන අයදුම්කාරියගේ ස්ථාන මාරුව වාර්ෂික ස්ථාන මාරු හෝ රජයේ සේවා අවශ්‍යතාවය මත සිදු කර ඇති ස්ථාන මාරුවක් නොවන බව සහ ඇය දරු ප්‍රසූතියකට සූදානම්ව සිටීම නිසා ඇතිවූ ගමනාගමන දුෂ්කරතාවයක් මත පදනම්ව පුද්ගලික ඉල්ලීමක් මත සිදු කර ඇති ස්ථාන මාරුවක් බව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තොරතුරු නිලධාරිණී පී.ඒ.ආර්. ධර්මවර්ධන මිය විසින් පැමිණිලිකරු විසින් තොරතුරු දැන ගැනීමේ පනතේ ප්‍රතිපාදන යටතේ සිදු කර ඇති ඉල්ලීමකට ප්‍රතිචාර ලෙස 2021-03-09 දාතමින් ලබාදී ඇති ලිඛිත ප්‍රතිචාරය අනුව පැහැදිලි වේ.

පැමිණිලිකරු සඳහන් කරන අනෙක් අයදුම්කරු වන බලපිටිය මූලික රෝහලට ස්ථාන මාරු ලබා ඇති කේ.පී. වීරක්කොඩි මහතා කොළඹ ජාතික රෝහලේ සිට බලපිටිය මූලික රෝහල වෙත ස්ථාන මාරු ලබා ඇත්තේ ඔහුගේ ඉල්ලීමක් මත බවත් එය චක්‍රලේඛයේ සඳහන් පරිදි වාර්ෂික ස්ථාන මාරු හෝ රජයේ සේවා අවශ්‍යතා මත සිදු කර ඇති ස්ථාන මාරුවක් නොවන බව 2021-02-18 දිනැතිව පැමිණිලිකරු වෙත වෛද්‍ය අධිකාරී චන්දන රත්නසිරි මහතා විසින් තොරතුරු දැන ගැනීමේ පනත යටතේ පැමිනිලිකරු සිදු කර ඇති ඉල්ලීමට ප්‍රතිචාර ලෙස ලිඛිතව දන්වා ඇත. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ අවස්ථාවන්හිදී ධර්මාශෝක විදුහල නියෝජනය කර ඇති නියෝජ්‍ය විදුහල්පතිවරයා වෙතින් විමසීමේදී ඔහුගේ පිළිතුර වී ඇත්තේ අභියාචනා විරෝධතා අවස්ථාවේදී ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට පැමිණිලිකරුට අවස්ථාව හිමිව තිබුණත් පැමිණිලිකරු එසේ කටයුතු කර නොමැති බවත් එම කාලසීමාවෙන් පසුව ඉදිරිපත් කරන විරෝධතා සම්බන්ධව

කටයුතු කිරීමේ හැකියාවක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හෝ අභියාචනා විරෝධතා මණ්ඩලයට නොමැති බවයි. කෙසේ වෙතත් පැමිණිලිකරු ස්ථාන මාරු ගණය යටතේ ලබා ගෙන ඇති මුළු ලකුණු 72 ක ප්‍රමාණය සහ ඔහුගේ දරුවා පොරොත්තු ලේඛනයේ දෙවනස්ථානයේ රැඳී සිටීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය ලෙස ධර්මාශෝක විද්‍යාලය විරෝධය දැක්වීමක් සිදු කර නැත. මෙහිදී පැමිණිලිකරු විසින් සිය විරෝධය ඉදිරිපත් කරන කාරණය සම්බන්ධව විමසීමට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ (ජාතික පාසල්) විමර්ශනයට කැඳවා ඇතත් ඔවුන් ඊට ප්‍රතිචාර දක්වා නොමැති අතර අවසන් වශයෙන් 2022-02-22 දාතමින් යොමු කර ඇති ලිපියටද මේ දක්වා පිළිතුරු ලබාදී නොමැත.

**නිරීක්ෂණ**

මෙම පැමිණිල්ලට අදාළව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී දෙපාර්ශවය ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු අනුව පහත නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකිය.

01 පැමිණිලිකරු විසින් චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව ධර්මාශෝක විද්‍යාලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කළ බව කියන දෙමාපියන් අතුරින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගමෙහි සේවය කරන බව පැවසෙන පෙරුමාදුර ඉඳුනිල් ප්‍රියංගනී ද සොයිසා යන අය ගමනාගමන දුෂ්කරතාවයන් පදනම් කරගෙන පුද්ගලික ඉල්ලීමක් මත ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සිට අම්බලන්ගොඩ ශාඛාව වෙත ස්ථාන මාරුවක් ලබා ගෙන ඇති අතර එය වාර්ෂික ස්ථාන මාරු ගණයට අදාළ නොවන බව නිරීක්ෂණය වේ. (පැ. 03 ලේඛනය)

02 බලපිටිය මූලික රෝහලෙහි හෙද නිලධාරියෙකු ලෙස කටයුතු කරන කේ.ජී. වීරක්කොඩි යන අය ඔහුගේ පෞද්ගලික ඉල්ලීම මත 2018-08-28 දින ස්ථාන මාරුවක් ලබා ඇති බව අනාවරණය වන අතර කොළඹ ජාතික රෝහලේ සිට ඔහු මෙම ස්ථාන මාරුව සිදු කරගෙන ඇති අතර තොරතුරු දැන ගැනීමේ පනතේ බලතල ප්‍රකාරව පැමිණිලිකරු ලබා ගෙන ඇති තොරතුරු වලට අනුව එම ස්ථාන මාරුවද 29/2019 චක්‍රලේඛයේ 7.6 වගන්තියේ ප්‍රතිපාදන වලට පටහැනිව සිදු කර ගෙන ඇති බව නිරීක්ෂණය වේ. (පැ.04 ලේඛනය)

**නිගමනය**

ඉහත නිරීක්ෂණයන් අනුව පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇති පරිදි අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලේ 2021 පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළව 29/2019 චක්‍රලේඛයේ 7.6 වගන්තියේ සඳහන් කර ඇති පරිදි රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම්/ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් යන ගණය යටතේ අයදුම් කර ඇති තමා ලකුණු 72 ක් ලබා සිටියදී වාර්ෂික ස්ථාන මාරු හෝ සේවා අවශ්‍යතාවය මත නොව වෙනත් හේතු මත ස්ථාන මාරු ලැබූ අයදුම්කරුවන් දෙදෙනෙකුගේ දරුවන් දෙදෙනෙකු චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව ඇතුළත් කර ගැනීම මගින් පැමිණිකරු වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකමක් වන නීතිය ක්‍රියාත්මක කිරීම සර්ව සාධාරණව සිදුවිය යුතුය යන වගන්තිය පළමු වගඋත්තරකාර පාර්ශවය වන විදුහල්පති අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකලාපය හේතුවෙන් උල්ලංඝණය වී ඇති බව නිගමනය කරමි.

**නිර්දේශය**

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලේ 2022 වසරේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් විදුහල්පති ධර්මාශෝක විද්‍යාලය වෙත නියෝග ලබා දියයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ. 2022.05.20 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

රේ/-

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා.